# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2276/04 - 2022 අප්‍රේල් මස 18 වැනි සඳුදා - 2022.04.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/78 (xv) (බී).

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන වගන්තිය සහ 139 වන වගන්තිය සමග කියවිය යුතු 27(1) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය, දිනේෂ් ගුණවර්ධන වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින්, ඉහත කී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර, එකී පනතේ 21වන වගන්තිය යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලැබිය යුතු, ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වමින්, (කලින් කලට සංශෝධිත පරිදි වූ) 2006 ජුනි මස 9 වැනි දින අංක 1448 /27 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ උපලේඛනය, (2017 ජුනි මස 30 වැනි දින අංක 2025/39 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති පරිදි) ඒ උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන ''ශාස්ත්‍ර පීඨය'' යන අයිතමයට අනුරූපව උපලේඛනයේ II වන තීරයේ දැක්වෙන ''11. ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයන අංශය'' යන සටහනට ඉක්බිතිව ම පහත දක්වෙන අලුත් සටහන එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ. :-

''12. තොරතුරු තාක්ෂණ අධ්‍යයන අංශය''.

දිනේෂ් ගුණවර්ධන,
අධ්‍යාපන අමාත්‍ය.

2022 අප්‍රේල් මස 08 වැනි දින,
කොළඹ දී ය.

EOG 04-0067